ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංකය : පීඑස්/එස්පී/චක්‍රලේඛ/27/2020

2020 අගෝස්තු මස 19 වන දින

අග්‍රාමාත්‍ය ලේකම්
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
හා සියළු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්

**<u>පෞද්ගලික කාර්ය මණ්ඩල මගින් අමාත්‍යාංශ සම්බන්ධ
කටයුතු වල නිරතවීම හා ලිපි නිකුත් කිරීම</u>**

ඉහත කරුණ පිළිබඳව මා විසින් නිකුත් කර ඇති 2020 පෙබරවාරි මස 07 වන දින දරණ හා 2020 අගෝස්තු මස 11 වන දින දරණ චක්‍රලේඛන වලට වැඩිමනත්වයි.

අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු අමාත්‍යවරුන් හා ගරු රාජ්‍ය අමාත්‍යවරුන්ගේ පෞද්ගලික ලේකම්වරු, මහජන සම්බන්ධතා නිළධාරින් හා අනෙකුත් කාර්ය මණ්ඩල නිළධාරින් විසින් අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු අමාත්‍යවරුන්, ගරු රාජ්‍ය අමාත්‍යවරුන් වෙනුවෙන් රාජ්‍ය කටයුතු, ව්‍යාපෘති හෝ වෙනත් මූල්‍ය ගණුදෙණු සඳහා ලිපි නිකුත් කිරීම හෝ දුරකථන ඇමතුම් ලබාදීම හෝ සම්බන්ධවීමෙන් වැලකීම හා රාජකාරි කටයුතුවලට සම්බන්ධවීමේදි අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා හෝ බලය පවරා ඇති නිළධාරින්ගේ උපදෙස්, අනුදැනීම හා අනුමැතීන් යටතේ කටයුතු කිරීමට වගබලා ගන්නා ලෙස අග්‍රාමාත්‍ය ලේකම්, අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්ට උපදෙස් දෙන ලෙස අතිගරු ජනාධිපතිතුමන් විසින් මා වෙත නියෝග කර ඇත.

තවද, අතිගරු ජනාධිපතිතුමන්, ගරු අග්‍රාමාත්‍යතුමන්, ගරු අමාත්‍යවරුන් හා ගරු රාජ්‍ය අමාත්‍යවරුන් වෙනුවෙන් එවැනි ලිපි නිකුත් කිරීම හෝ දුරකථන පණිවිඩ ලබාදිය හැක්කේ අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ අනුමැතියට යටත්ව පමණක් බවටද උපදෙස් දී ඇත.

අදාළ ලේකම්වරුන් විසින් ගරු අග්‍රාමාත්‍යතුමන්, ගරු අමාත්‍යවරුන් හා ගරු රාජ්‍ය අමාත්‍යවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩල මේ පිළිබඳ දැනුවත් කිරීමටත්, ඔවුන්ගේ



ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones ++ 94 (0) 11 2354418 ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax ++ 94 11 2446657
ඉ-තැපැල / மின்-அஞ்சல் / e-mail prsec@presidentsoffice.lk

කාර්යාල පටිපාටීන් පිළිබඳ අවබෝධ කර මග පෙන්වීමට කටයුතු කිරීමට උපදෙස් දෙන ලෙසද මා වෙත උපදෙස් දී ඇත.

අදාළ පෞද්ගලික කාර්ය මණ්ඩල, ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය හා අමාත්‍යාංශ කාර්යාල නිළධාරීන් සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම සඳහා සහකාර ලේකම්වරයෙකු හා සමාන නිළධාරියෙකු යොදවා ගැනීම මගින් පෞද්ගලික කාර්ය මණ්ඩලවලට අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම පහසුවනු ඇතැයි විශ්වාස කරමි.

අමාත්‍යාංශ පෞද්ගලික කාර්ය මණ්ඩල කළමනාකරණ ගැටළු ඇත්නම් ඒවා කඩිනමින් විසඳා ගැනීමටද, එම කාර්ය මණ්ඩලවල වගකීම් හා කාර්යභාරය මනා ලෙස පැහැදිලි කිරීමට කටයුතු කරන ලෙසද, කිසියම් හෝ අපැහැදිලි බවක් ඇත්නම් හා එම ගැටළු නිරාකරණය කර ගැනීමේ දුෂ්කරතා ඇත්නම්, ඒ පිළිබඳ මා වෙත වාර්තා කරන ලෙසද දන්වමි.

එබැවින්, අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු අමාත්‍යවරුන් හා ගරු රාජ්‍ය අමාත්‍යවරුන්ගේ උපදෙස් මත වගකීමෙන් හා රජයේ ගෞරවණීයත්වය ආරක්ෂා වන අයුරින් කටයුතු කිරීමට අදාළ පෞද්ගලික කාර්ය මණ්ඩල දැණුවත් කරන ලෙස මෙයින් දන්වමි.

පී. බී. ජයසුන්දර
ජනාධිපති ලේකම්